## ටී.එම්. ඩබ්ලිව්. පී. ගුරුගේ එ. තැපැල් මූලස්ථානය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1263 /2019 (2019.09.03 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - **ටී.එම්. ඩබ්ලිව්. පී. ගුරුගේ**
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, **තැපැල් මූලස්ථානය**

**පෙනීසිටීම**
අභියාචක - **ටී.එම්. ඩබ්ලිව්. පී. ගුරුගේ**
පොදු අධිකාරිය - ආර්. ගුණරත්න, තොරතුරු නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.11.08 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.05 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.12.17 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.31 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.02.18 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.11.08 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදී.

*පො. මා.ජ. අංක 24/සී 3/22/2018 හා 2018.08.06 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි අභියාචකගේ රාජකාරී වැඩ වැටුප් රහිතව තහනම් කරන ලදී. අමාත්‍යාංශය ආයතන සංග්‍රහයේ XL VIII:31:3 අනුව 'රාජ්‍ය නිලධරයෙකුගේ රාජකාරී වැඩ තහනම් කිරීමට තීරණයක් ගනු ලබන බලධරයෙකු විසින් එසේ ගනු ලැබූ තීරණයකට පදනම් කොට ගත් හේතුන් පැහැදිලිවත් හා නිශ්චිතවත් අදාළ ලිපි ගොනුවෙහි සටහන් කර තැබිය යුතු වන්නේය' ලෙස සඳහන්ව ඇත.*
*ඒ අනුව අභියාචකගේ රාජකාරී වැඩ තහනම් කිරීමේ හේතුව නිශ්චිතව අභියාචක විසින් දැන ගත යුතුව ඇති අතර තොරතුරු දැන ගැනීමේ පනතට අනුව අදාළ කාරණයට පදනම් කොටගත් හේතුන් සඳහන් වාර්තාවේ පිටපතක්*

2018.12.05 දිනැතිව ප්‍රතිචාර දක්වමින්, තොරතුරු නිලධරයා සඳහන් කර සිටින ලද්දේ අභියාචක විසින් ඉල්ලා ඇති රාජකාරි වැඩ තහනම් කළ නිලධාරීන් සම්බන්ධව මේ වන විට මූලික විමර්ශන පරීක්ෂණ කටයුතු සිදු වන බැවින්, උක්ත ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දීමට නොහැකි බවය. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.12.17 දින නම්කළ නිළධාරියාට අභියාචනයක් යොමු කරන ලදි. නම්කළ නිළධාරියා 2018.12.31 දිනැතිව ප්‍රතිචාර දක්වමින් සඳහන් කර සිටින ලද්දේ පනතේ 04 (ඌ) උප වගන්තිය යටතේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබාදිය නොහැකි බවයි. මෙම ප්‍රතිචාරයෙන්ද අතෘප්තියට පත් අභියාචක 2019.02.18 වන දින කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.
මෙහිදී අභියාචක කරුණු දක්වා සිටියේ වසරකට ආසන්න කාලයක් ගතව ඇතත් වැඩ තහනම් කිරීමට හේතු වූ කරුණු තමන් හට මෙතෙක් දන්වා නොමැති බවයි. ඒ අනුව වැඩතහනමට ලක් කිරීම සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව/හේතු පිළිබඳව දැනගැනීමට තමන් හට අවශ්‍ය වන බව අභියාචක සඳහන් කර සිටින ලදි.
එසේම කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටින්නේ මෙම තොරතුරු ඉල්ලීමට අදාළව වැඩ තහනමට ලක් කිරීම සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව/හේතු අභියාචක වෙත ලබාදීමේ කිසිදු බාධාවක් නොමැති බවයි.
ඒ අනුව අදාළ මූලික විමර්ශන වාර්තාව/හේතු අභියාචක වෙත ලබා දීමට පොදු අධිකාරිය විසින් එකඟවන ලදි.

**නියෝගය:**

ඒ අනුව අභියාචක විසින් ඉල්ලා ඇති පරිදි වැඩ තහනමට පදනම් වූ මූලික විමර්ශන වාර්තාව/හේතු සති දෙකක කාලයක් ඇතුළත අභියාචකට ලබා දිය යුතු බවත් එහි ආවරණ ලිපියේ පිටපතක් කොමිෂන් සභාවටද යොමුකරන ලෙසත් පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****